*සැ. යු.-* 2022.09.02 දින පළ කරන ලද අංක 2296 *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,297 - 2022 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2022.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 592 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 595 |


*සැ. යු.-* පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 සැප්තැම්බර් මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 සැප්තැම්බර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මහනුවර දිසා අධිකරණයේ දී ය

1994 අංක, 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

නඩු අංකය : DDR/510/2017
ඇස්කීසි අංකය : 213/19

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී.,

*පෙර නාමය*

පීපල්ස් ලීසිං කම්පැනි පී. එල්. සී.,
අංක 1161,
මරදාන පාර,
කොළඹ 10.

*-පැමිණිලිකරු-*

-එදිරිව-

(01) අෂෝ කාර්ස් ජැපෑන් (පී. වී. ටී.) එල්. ටී. ඩී.,
(Asho Cars Japan (Pvt) Ltd.)
අංක 396,
කටුගස්තොට පාර,
මහනුවර.

(02) හේරත් මුදියන්සේලාගේ අශෝක ප්‍රියන්ත බණ්ඩාර හේරත් *නොහොත්* හේරත් මුදියන්සේලාගේ අසෝක ප්‍රියන්ත බණ්ඩාර හේරත්,
අංක 396,
කටුගස්තොට පාර,
නුවර.

(03) කහඳගමගේ චන්දිමා ගයානි කහඳගම
අංක 147,
හල්ගොල්ල 02,
හපුගස්තලාව,
නාවලපිටිය.

*-විත්තිකරුවන්-*

දැනට මහනුවර, කටුගස්තොට පාර, අංක 396 දරන 1 වන විත්තිකරු වන අෂෝ කාර්ස් ජැපෑන් (පී. වී. ටී.) එල්. ටී. ඩී. (Asho Cars Japan (Pvt) Ltd.) ද, මහනුවර, කටුගස්තොට පාර, අංක 396 හි පදිංචි 2 වන විත්තිකරු වන හේරත් මුදියන්සේලාගේ අශෝක ප්‍රියන්ත බණ්ඩාර හේරත් *නොහොත්* හේරත් මුදියන්සේලාගේ අසෝක ප්‍රියන්ත බණ්ඩාර හේරත් සහ නාවලපිටිය, හපුගස්තලාව, හල්ගොල්ල 03, අංක 147 හි පදිංචි 3 වන විත්තිකරු වන කහඳගමගේ චන්දිමා ගයානි කහඳගම යන අයවලුන් වෙතටයි.

වර්ෂ 2017 ක්වූ දෙසැම්බර් මස 20 දින කොළඹ දිසා අධිකරණයේ අතිරේක දිසා විනිසුරු අමාලි රණවීර මැතිණිය ඉදිරිපිට දී සුදුස්සක් කිරීමට ඉදිරිපත් වූ අවස්ථාවේ පැමිණිල්ලද සමග අමුණා ඇති ලියවිලි ද සලකා බැලීමෙන් පසු පැමිණිලිකාර ආයතනයේ බලයලත් නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ අඩංගු ප්‍රකාශයන් පිළිබඳව සෑහීමකට පත්ව ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන වගනම් පහත දැක්වෙන මුදල් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවයි.

එනම්, 2017.08.25 දිනට ශ්‍රී ලංකා මුදලින් රුපියල් දස කෝටි හැටහතර ලක්ෂ දොළොස් දහස් හාරසිය අනූ තුනක් සහ ශත දහඅටක (රු. 106,412,493.18) මුදලක් හා එකී මුදලින් ප්‍රාග්ධන ණය මුදල ලෙස අයවිය යුතු රු. 63,470,776.63 ක මුදලක් මත 2017.08.26 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 12% ක් බැගින් වූ බලාත්මක පොළී ප්‍රතිශතයක් මත ගණනය කළ පොළිය ද, තීන්දු ප්‍රකාශිත දින සිට, තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත අදාළ නෛතික පොළිය ද එම මුදල අයකර ගැනීම සඳහා 1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතෙන් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව විත්තිකරුවන්ට විරුද්ධව ඇතුළත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තු ද ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවටද,

තවද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට එකී විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති හෙයින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයිතිය යටතේ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම, අයිතිවාසිකම හා ඊට අදාළ සෑම සියලු දේ, කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත නිකුත් කරන ලද ඇස්කීසිය මත මහනුවර දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 13 වැනි දින, නිසිලෙස තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් දේපළ,

**වර්ෂ 2022.09.30 වැනි දින පස්වරු 2.00** ට එකී දේපල පිහිටා ඇති කටුගස්තොට පාර, වරිපනම් අංක 396 හිදි ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය* :

මහනුවර නගර මධ්‍යයේ (ඔරලෝසු කණුව) පසුකර දළදා වීදිය දිගේ මීටර් 400ක් පමණ පසුකර ක්වීන්ස් හෝටලය හංදියේ සිට වමට හැරී ඩී. එස්. සේනානායක වීදිය පසුකර කි. මී. 03ක් පමණ ගමන් කරන විට මාර්ගයෙහි දකුණු පැත්තෙහි මෙම ඉඩම හමු වේ.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සදහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් බාරගනු නොලැබේ.

1. සම්පූර්ණ ගැණුම් මුදලෙන් 25% ක මුදලක්, ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ඉහත අංක දරන නඩුවට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

2. පිස්කල් ගාස්තු/වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා බල සීමාවේ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සියඹලාගස්තැන්න අංක 226 ග්‍රාම නිලධාරී වසමේ කටුගස්තොට පාරේ පිහිටි වරිපනම් අංක 396 දරන ගොඩනැගිල්ල සමග එස්. ටී. බ්‍රිජට් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්. එම්. වීරකෝන් මහතා විසින් මැන සාදන ලද 2011.06.05 දිනැති පිඹුරු අංක 19403 දරන පිඹුරෙන් බෙදා මැන සාදන ලද ලොට් 01 කොටසට මායිම් :

| | |
|---|---|
| උතුරට | : වරිපනම් අංක 396/1 දරන පරිශ්‍රය, කටුගස්තොට පාර, |
| උතුරු - නැගෙනහිර | : වරිපනම් අංක 01 දරන ඉඩම සියඹලාගස්තැන්න පල්ලිය සහ ඊට අයත් ඉඩම, |
| දකුණ නැගෙනහිර | : වරිපනම් අංක 394, කටුගස්තොට පාර, |
| දකුණ | : කටුගස්තොට පාර, |
| බස්නාහිර | : වරිපනම් අංක 396/1, කටුගස්තොට පාර, |

යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහයයි දශම හතරයි පහක් (පර්. : 26.45) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි ඉහත කී පිඹුරු අංක 19403 දරන පිඹුරට අනුව ගොඩනැගිලි, ගහකොළ වැව්ලි යනාදී සියලු දේ සමග වේ.

ඉහත ඉඩම පහත ඉඩමෙන් නැවත මැන සාදන ලද්දකි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා බල සීමාවේ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සියඹලාගස්තැන්න අංක 226 ග්‍රාම නිලධාරි වසමේ කටුගස්තොට පාරේ, කටුගස්තොට, අංක 400 සහ වරිපනම් අංක 396, 396/1 දරන ගොඩනැගිල්ල සමග ''එස්. ටී. බ්‍රිජට්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. තල්වත්ත මහතා විසින් මැන සාදන ලද 1960.07.31 දිනැති අංක 647 දරන පිඹුරේ ලොට් අංක 3, ලොට් අංක 4ඒ, ලොට් අංක 1ඒ, දරන කැබලි වලට මායිම් :

| | |
|---|---|
| උතුරට | : ඉහත පිඹුරේ ලොට් 4ඒ සහ ලොට් 1 බී, |
| උතුරු - නැගෙනහිර | : වරිපනම් අංක 01, සියඹලාගස්තැන්න පල්ලිය |
| දකුණ නැගෙනහිර | : මායිම් වැටකින් වෙන්වූ වරිපනම් අංක 394 සහ කටුගස්තොට පාර, |
| දකුණට | : කටුගස්තොට පාර, |
| බස්නාහිරට | : 647බී පිඹුරේ කැබලි අංක 4 බී, |

යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතයි දශම හතරයි නවයක් (පර්. 27.49) ක් විශාල පිඹුරු අංක 647බී බිම් ප්‍රමාණය සහ ගොඩනැගිලි, ගහකොළ වගාවන් යනාදී සියලු දේද සමග වේ.

බලයලත් මිනින්දෝරු එස්. එම්. තල්වත්ත මහතාගේ අංක 647බී සහ 1960.07.31 දිනැති ඉහත කී කැබැලි 3, 4ඒ, 1ඒ, වෙනත් මිනින්දෝරුවරයකු අනුව පහත පරිදි විස්තර වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා බල සීමාවේ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියඹලාගස්තැන්න අංක 226 ග්‍රාම නිලධාරී වසමේ කටුගස්තොට පාරේ, කටුගස්තොට වරිපනම් අංක 396 දරන ගොඩනැගිල්ල සමග එස්. ටී. බ්‍රිජට් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. අයි. අබ්ඩීන් මහතා විසින් මැන සාදන ලද 1996.05.14 දිනැති පිඹුරු අංක 985 දරන පිඹුරෙන් බෙදා මැන සාදන ලද ලොට් 01 කොටසට මායිම් :

| | |
|---|---|
| උතුරට | : වරිපනම් අංක 396/1 දරන පරිශ්‍රය, කටුගස්තොට පාර, |
| උතුරු - නැගෙනහිර | : වරිපනම් අංක 01 දරන ඉඩම සියඹලාගස්තැන්න පල්ලිය සහ ඊට අයත් ඉඩම |
| දකුණ නැගෙනහිර | : වරිපනම් අංක 394, කටුගස්තොට පාර |
| දකුණ | : කටුගස්තොට පාර, |
| බස්නාහිර | : වරිපනම් අංක 396/1, කටුගස්තොට පාර. |

යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතයි දශම හතක (පර්. 27.07) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි ඉහත කී පිඹුරු අංක 985 දරන පිඹුරට අනුව ගොඩනැගිලි, ගහකොළ වැව්ලි යනාදී සියලු දේ සමඟ වේ.

මෙම ඉඩම දැනට මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A 522/134 දරන පත් ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

අජන්තා උඩුවෙල,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය
පිස්කල්/ප්‍රොබේට් නිලධාරි
සාමදාන විනිශ්චයාකාර
මහනුවර දිසා අධිකරණය.

වර්ෂ 2022 ක්වූ අගෝස්තු මස 12 වැනි දින දී ය.

09-120

## මිනුවන්ගොඩ දිසා අධිකරණයේ දී ය

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම

1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

නඩු අංකය : DR/9/21
ස්වභාවය : ණය අයකර ගැනීම
වටිනාකම : රු. 2,794,402.00
ඇස්කිසි අංකය : 23/2022

සෙලාන් බැන්ක් පීඑල්සි
(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලද)
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලුපාර,
කොළඹ 03.

*පැමිණිලිකරු*

එදිරිව

ඔරියන්ට් ෆාමසි ඇන්ඩ් ග්‍රොසරි යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන

ගාර්දිය මලල්ගම පාලිත ප්‍රියන්ත කුමාර කරුණාරත්න
අංක 253/ A, බෝධිරාජ මාවත,
පොල්වත්ත,
මිනුවන්ගොඩ

සහ

අංක 03, උද්‍යාන පාර,
මිනුවන්ගොඩ,

විත්තිකරු

මිනුවන්ගොඩ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2022ක් වූ ජනවාරි මස 18 වන දින ඇතුලත් කර ලද නියත තීන්දු ප්‍රකාශයට අනුව විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු රුපියල් 1,617,000.00 ක ප්‍රතිව්‍යුහගත කරන ලද කාලීන ණය පහසුකම් 1 මත රුපියල් දාහත් ලක්ෂ හැත්තෑ නව දහස් හැට දෙකයි ශත හැට තුනක (රු.1,779,062.63) මුදලක් සහ රුපියල් දහසය ලක්ෂ දාහත් දහසක (රු. 1,617,000.00) මුදල මත වර්ෂ 2020.05.14 වන දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන දින තෙක් වසරකට 16% බැගින් පොළියද,

සහ රු. 934,000.00 ක ප්‍රතිව්‍යුහගත කරන ලද කාලින ණය පහසුකම් 11 මත රුපියල් දස ලක්ෂ පහලොස් දහස් තුන්සිය තිස් නවයයි ශත තිස් හයක (රු. 1,015,339.37) මුදලක් සහ රුපියල් නව ලක්ෂ තිස් තුන් දහස් දෙසිය පනහයි ශත පනස් දෙකක (රු. 933,250.52) මුදල මත වර්ෂ 2020.05.14 වන දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන දින තෙක් වසරකට 16% බැගින් පොළියද,

නඩු ගාස්තුද ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින්ද, ඒ අනුව ඉහත නම සඳහන් විත්තිකරුට අයත් දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සඳහන් වන දේපල පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකාර බැංකුවට අයකර දීම සඳහා වර්ෂ **2022ක් වූ ඔක්තෝබර් මස 04 වන දින පෙ. ව. 11.00** එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ අලුත්කුරු කෝරළේ රාගම පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා සහ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 290 දරන බොල්ලත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බොල්ලත ගමේ පිහිටි ''මූණමල්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් මැන සාදන ලද අංක 12116 සහ වර්ෂ 2003.02.09 වන දින දරන සහ වර්ෂ 2013.03.17 දින පිටසන් කරන ලද පිඹුරෙහි නිරූපිත ලොට් A දරන බිම් කොටස සඳහා මායිම්,

උතුරට : වික්ටර් රොඩ්රිගුගේ ඉඩම ද,
නැගෙනහිරට : ජාපින් නෝනාගේ ඉඩම ද,
දකුණට : ලොට් අංක B සහ පාර (ප්‍රාදේශීය සභා)
බස්නාහිරට : එල්. ඒ. ගුණසිංහගේ ඉඩම ද

යන මායිම් තුළ වූ පර්චස් විසි හතරයි දශම තුනයි අටක් (පර්. 24.38) විශාලත්වයෙන් යුතු බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගස් වගාවන් ඇතුලු සියලු දේද වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත් ඉරු P/34/106 හි ලියාපදිංචි වී ඇත.

*දේපලට පිවිසීම,* ගනේමුල්ල හන්දියේ සිට කඳාන පාර ඔස්සේ මීටර් 300ක් ගොස්, දකුණට ඇති ජා ඇල පාරට හැරී 2 km ක් දුරින් ඇති බුද්ධ ප්‍රතිමාව දක්වා පැමිණ, වමට ඇති පන්සල පාරෙන් මීටර් 200ක් ගියපසු දකුණට රණවිරු ප්‍රියන්ත පාර හමුවේ. එම පාරෙන් මීටර් 150ක් ගියපසු දකුණට වන්නට මෙම විෂයගත දේපල පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය :* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. (1) ගැණුම් මිලෙන් 25% (2) පළාත් අධිකාරියේ බදු සඳහා 1% (3) ප්‍රචාරණ වියදම් (4) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද, ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත මිනුවන්ගොඩ දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. අංශ ප්‍රධානි - නීති, සෙලාන් බැන්ක් පීඑල්සී - අංක 90, ගාලු පාර, කොළඹ 03.- 112456485, 0112456479.

ජී. එම්. රමනි වීරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමවිනිසුරු/ප්‍රොබේට් නිලධාරි,
දිසා අධිකරණය - ගම්පහ.

වර්ෂ 2022 ක් වූ අගෝස්තු මස 31 වැනි දින දී ය.

09-137

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

(වෛද්‍ය) උපුල් ගලප්පත්ති වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ ''ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

(අ) පෝෂණ ක්ෂේත්‍රයේ මූලික, සායනික හා ව්‍යවහාරික ඉගැන්වීම්, පුහුණුකිරීම් හා පර්යේෂණ දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ ඉහළ නැංවීම;

(ආ) මූලික, සායනික හා ව්‍යවහාරික පෝෂණය සම්බන්ධ විද්‍යාත්මක කාරණා හමුවී සාකච්ඡා කිරීම සඳහා මණ්ඩපයක් සලස්වාදීම;

(ඇ) පෝෂණ ක්ෂේත්‍රය හා එම ක්ෂේත්‍රයේ ප්‍රවණතා සම්බන්ධ ලේඛන හා වාර සඟරා මුද්‍රණය කිරීමට, ප්‍රකාශනය කිරීමට සහ එහි සාමාජිකයන් අතර බෙදා හැරීම;

යනාදිය වේ.

(වෛද්‍ය) උපුල් ගලප්පත්ති,
පාර්ලිමේන්තු මන්ත්‍රී.
හම්බන්තොට දිස්ත්‍රික්කය.

09-159

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.